ශ්‍රී ලංකාවේ මාධ්‍ය ආයතන සහ ලිංගික අතවරයන්/බලහත්කාරකම් සම්බන්ධයෙන් සංවාදයක් පසුගිය දිනවල සමාජ මාධ්‍ය තුළ පුළුල් ලෙසින් සිදුවනු දක්නට ලැබිණි. මේ එම ශ්‍රී ලංකාවේ මාධ්‍ය ආයතන සහ ලිංගික අතවරයන් පිළිබඳ සංවාදයත්, ඊට අදාළ ඇතැම් චෝදනාවන් ශ්‍රී ලංකාවේ සිංහල සහ ඉංග්‍රීසි පුවත්පත් ඔස්සේ සහ සහ එම පුවත්පත්වල නිල සමාජ මාධ්‍ය පිටු ඔස්සේ ඉදිරිපත් කොට තිබූ අයුරු අපට නිරීක්ෂණය කරන්නට හැකිවූ ආකාරයයි (යාවත්කාලීන කළ දත්ත). එහිදී ඇතැම් පුවත්පත් එය කතාබහට ගෙන තිබූ ආකාරයත්, තවත් පුවත්පත් ඒ සම්බන්ධයෙන් මෙතෙක් අවධානය යොමු කොට නොතිබූ ආකාරයත් දැකගත හැක.
මෙහිදී ශ්‍රී ලංකාවේ මාධ්‍ය ආයතන සහ ලිංගික අතවරයන් පිළිබඳ සඳහන් කරන්නට යෙදුණු, නමුත් අපගේ නිරීක්ෂණයට හසු නොවූ වෙනත් පුවත්පත් තිබේද? එසේ නම් එම වාර්තාවන්ද අප වෙත යොමු කරන මෙන් අපි ඔබෙන් ඉල්ලා සිටිමු.
ශ්‍රී ලංකාවේ මාධ්‍ය ආයතන සහ ලිංගික අතවරයන් සම්බන්ධයෙන් පුළුල් සංවාදයක් ඇතිවිය යුතු යැයි ඔබ සිතන්නේද? ඒ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?
#MediaEthicsSL